# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2290/33 - 2022 ජූලි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, අනුර කුමාර මනතුංග වන මා විසින්, ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමතය සහිතව, මේ නිවේදනය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා "පුරා විද්‍යාත්මක කටයුතු" සඳහා වෙන් කළ භූමියක් ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**අනුර කුමාර මනතුංග,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2022 ජූලි මස 18 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

**පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ මාමඩුව පූර්ව ඓතිහාසික - මුල් ඓතිහාසික සුසාන භූමි සංකීර්ණ ප්‍රදේශය**

උතුරු පළාතේ, වව්නියාව දිස්ත්‍රික්කයේ, වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අග්බෝපුර සී213ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අග්බෝපුර ගම පිහිටි, අංක 5 දරන සර්වේයර් ජනරාල්ගේ අවසාන භූමිතික පිඹුරට කරන ලද්ද වූ ද සර්වේයර් ජනරාල්

1A - G 37141 — 08 (2022/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙනුවෙන් වව්නියාව දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි පී. එල්. වයි. සෙනෙවිරත්න විසින් 2019.10.22 දින අනුමත කරන ලද්ද වූ ද 2019.10.16 දිනැති අතිරේක අංක 11 හා පත්‍ර අංක 13 හි සඳහන් කැබලි අංක 336 වශයෙන් පෙන්නුම් කර ඇති පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ මාමඩුව පූර්ව ඓතිහාසික - මුල් ඓතිහාසික සුසාන භූමි සංකීර්ණ ප්‍රදේශය සඳහා මායිම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | - | කැබලි අංක 337, මාර්ගය (ලොට් 337), 337, මාර්ගය (කැබලි අංක 337), 337 සහ 14 |
| *නැගෙනහිරට* | - | කැබලි අංක 14, 337, 333, 337 සහ මාර්ගය (ප්‍රාදේශීි සභා) (කැබලි අංක 337) |
| *බටහිර* | - | කැබලි අංක 337 |
| *දකුණට* | - | කැබලි අංක 337 සහ මාර්ගය (ප්‍රදේශීය සභා) (කැබලි අංක 337) |

ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 26, රූඩ් 2, පර්චස් 27.0 *හෙවත්* (හෙක්ටයාර් 10.7922) ක් වූ ඉඩම් ප්‍රමාණයන් වේ.

EOG 07 - 0160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.